# "සරිගම" උපත ලැබුවේ ඕස්ට්‍රේලියාවේ



**ශ්‍රී ලංකාව සිනමා ඉතිහාසයේ වඩාත්ම ආකාර්ශනීය සිනමාකරුවා මෙන්ම ශ්‍රී ලංකාවට වැඩිම අන්තර් ජාතික සිනමා සම්මාන ගෙනැවිත් ඇත්තේද ආචාර්ය සෝමරත්න දිසානායකයි. ශ්‍රී ලංකා සිනමා ඉතිහාසයේ වැඩිම ආදායම් ඉපැයූ චිත්‍රපටය, වැඩිම ප්‍රේක්ෂක පිරිසක් නැරඹූ චිත්‍රපටය, එක් දිනකදී වැඩිම ආදායම් ලැබූ චිත්‍රපටය ආදී සියළුම වාර්තාවල හිමිකරුවා ඔහුය. ඔහුගේ අළුත්ම චිත්‍රපටය "සරිගම" ඕස්ටේ්‍රලියාව පුරා තිරගත වීමට නියමිතව ඇති මෙම මොහොතේ වැඩිදුර තොරතුරු විමසීම සඳහා අපි ඔහු සමග සාකච්ජා කළෙමු.**

**කොහොමද සරිගමෙ චිත්‍රපටයට ලංකාවේ ප්‍රතිචාර ?**

ඉතාම ඉහළයි. අපි හිතුවටත් වඩා ඉතා ඉහලින් ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකයින් ''සරිගම'' වටා එකතු වුණා. බොහෝ විචාරකයින් හා රසිකයින් කියන්නේ ''සරිගම'' මගේ මෙතෙක් නිර්මාණ අතර හොඳම නිර්මාණය කියලා.

**ඒ අදහස් ගැන ඔබේ අදහස කුමක්ද ? ඔබ එයට එකඟ ද ?**

අම්මෙක් තාත්තෙක් කොහොමද තමන්ගෙ ළමයි අතරින් හොඳම ළමයා තෝරන්නෙ. ඒ වගේ මගේ එදා මෙදා තුර සියළුම චිත්‍රපට මට මගේ හොඳම චිත්‍රපට.

**ඒ වුණාට ''සරිගම'' ඔබගේ මෙතෙක් සිනමා රටාවෙන් පිට පැන්න නිර්මාණයක් නේද ?**

ඔව්. මගේ මෙතෙක් නිර්මාණය වූ චිත්‍රපට වලට වඩා වෙනස්කම් රාශියක් සරිගම චිත්‍රපටයේ තියෙනවා. ඒ වගේම සමානකමුත් තියෙනවා.

**ඒ මොනවාද ?**

වෙනස්කම් තමයි, මම පළමු වතාවට විදෙස් නිර්මාණයක් පාදක කරගෙන අනුවර්තනයක් කරන්නේ. මෙය 1965 දී නිර්මාණය වූ ඔස්කා සම්මාන 7 ක් දිනූ, Sound of Music" කියන ඉංග්‍රීසි චිත්‍රපටය පාදක කරගෙන නිමවූ අනුවර්තනයක්. අනිත් වෙනස තමයි මෙය සංගීතමය චිත්‍රපටයක්. මෙහි ගීත 13 ක් තියෙනවා. මගේ අනිත් චිත්‍රපටවල ප්‍රධාන චරිත කලේ එක ළමයෙක් හෝ දෙන්නෙක්. සරිගම චිත්‍රපටයේ ළමයි 7 දෙනෙක් ඉන්නවා.

ප්‍රඃ මොනවද සමානකම් ?

උඃ අතින් සියළුම චිත්‍රපට වගේ සිරිගම පවුලේ සියළු දෙනාට එකට නැරඹිය හැකි චිත්‍රපටයක්. මගේ අනිත් චිත්‍රපට වගේම දෙමාපියන් ළමයි සමග තමයි චිත්‍රපටය බලන්න එන්නේ. අනිත් සමානකම තමයි චිත්‍රපටය එක් වරක් නැරඹූ අය නැවත නැවතත් නැරඹීම.

**ඔබ මෙතෙක් කළ නිර්මාණ සියල්ලම ඔබගේ ස්වතන්ත්‍ර නිර්මාණ. ''හොඳම තිර රචකයා'' ඔබ කීප වතාවක්ම ජාතික සම්මාන වලට පවා පාත්‍ර වුණා. එසේ හැකියාව තිබියදී විදෙස් නිර්මාණයක් පාදක කරගත්තේ ඇයි?**

මගේම ස්වතන්ත්‍ර නිර්මාණ වල හිඟයක් මට නෑ. අළුත්ම පිටපත් රාශියක් දැනටමත් මා සතුයි. නමුත් මේ නිර්මාණයට මට සම්බන්ධ ඉතිහාසයක් තියෙනවා. 1985 මම Sydney විශ්ව විද්‍යාලයේ මගේ MSA. උපාධිය සඳහා කලේ සිනමාකරණය. එහිදී මට පැවරී තිබුණ එක් ව්‍යාපෘතියක් තමයි ''සාහිත්‍ය සිනමාවට පෙරලීම'' (Transformation of Literature in to Cinema) කියන නිබන්ධනය කිරීම. එහිදී මම තොරාගත්තේ මරියා වොන් ට්‍රැප් (Maria Von Trapp) කියන ලේඛිකාව රචනා කළ ඇගේ ජීවිත කතාව, "The Von trapp Family Singers" කියන ග්‍රන්ථය පාදක කරගෙන කොහොමද, Sound of Music" කියන චිත්‍රපටය නිර්මාණය වුණේ කියන එක. ඒ නිර්මාණ දෙකම තුළ තිබූ මානව දයාව, සෞන්දර්යය, හා ගීතවත් භාවය නිසාම මම ඒ වකවානුවේම තමයි හිතාගත්තේ කවදාහරි මම මේ කතාව පාදක කරගෙන සිංහල චිත්‍රපටියක් හදනව කියල. එහි ප්‍රතිඵලය තමා සරිගම. ඒ නිසා ''සරිගම'' උපත ලැබුවේ ඕස්ට්‍රේලියාවේ කීවොත් හරි.

**ඒ කියන්නේ සරිගම කොපියක් ද ?**

නෑ කොපියක් කියන එක බොහොම බාල වචනයක්. එහෙම ඒවත් ලංකාවෙ වෙනවා. ලාංකීය සිනමාවේ ආරම්භයේ තිබුනෙ ඉන්දීය චිත්‍රපට කොපි. සිංහල දෙබස් හා නළුනිලියන් පමණයි වෙනස් වෙලා තිබුණෙ. අනුවර්ථන කියන එක වෙනත් කලාවක්. බොහෝ විශ්ව සම්භාව්‍ය නිර්මාණ විවිධ භාෂාවන්ට පරිවර්තනය වෙනවා. අනුවර්තනය වෙනවා. එය එසේ විය යුතුයි. ලංකාවෙ උදාහරණ ගත්තොත් කොපමණ විදෙස් කෘතීන් සිංහලට පෙරලිලා තියෙනවාද ? නවකතා, කෙටිකතා, කවි, වේදිකා නාට්‍ය, ගීත උදාහරණ කොච්චර තියෙනවාද ? එක උදාහරණයක් හිතන්න. ජර්මන් ජාතික බර්ටොල් බ්‍රෙෂ්ට් ගේ, The Cocacian chelk Circle" කියන විශ්ව සම්භාව්‍ය නාට්‍ය හෙන්රි ජයසේනයන් ''හුණුවටයේ කතාව'' කියල සිංහලට අනුවර්තනය කලා. එහි ඇති වරදක් නෑ. ඒක තමයි විශ්ව සම්භාව්‍ය නිර්මාණ සිංහල රසිකයින්ට දෙන්න පුළුවන් හොඳම මාර්ගය ''සරිගම'' කියන්නෙත් එවන් නිර්මාණයක්.

**සරිගම මුල් කෘතියෙන් වෙනස් වීම් තියෙනවද? නැත්නම් එසේම පරිවර්තනයක් ද?**

සරිගම පරිවර්තනයක් (Translation) නෙවෙයි. අනුවර්තනයක් (adaptation) ඒ කියන්නෙ මුල් වස්තු බීජය මත වෙනස්කම් සහති කෙරෙන නව නිර්මාණයක්. මෙහි එන දෙබස් ගීත හා සිදුවීම් ලාකංවට ගැලපෙන විදියට මම බොහෝ වෙනස්කම් වලට භාජනය කලා.

**එම වෙනස්කම් සාර්ථකයි කියල හිතනවද?**

බලාපොරොත්තු වුණාටත් වැඩියෙන් සාර්ථකයි. ඇතැම් විචාරකයින් කියන විදියට මුල් කෘතියටත් වඩා බොහෝ සෙයින් සාධනීය වෙනස් කම් සහිතයි. සරිගම බැළුවට පස්සෙ අපේ රට කොච්චර ලස්සන රටක්ද කියල ආඩම්බර හිතෙනව කියල බොහෝ අය කියනවා. රටින් පිටවෙලා ඉන්නෙ අපේ ශ්‍රී ලාංකිකයින්ට මේක හොඳටම දැනෙයි.




